(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 46.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 අගෝස්තු 21 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1879/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වකුගඩු රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම පිණිස මාතලේ දිස්ත්‍රික්කයේ ඇති සෞඛ්‍ය මධ්‍යස්ථාන කවරේද;

(iii) එම මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1920/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමවල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෝජනා ක්‍රමවල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන වෘත්තීන් කවරේද;

(iii) වාර්ෂිකව එම යෝජනා ක්‍රමවල සාමාජිකත්වය ලබා ගන්නා සංඛ්‍යාව කොපමණද;

(iv) එම සාමාජිකයන්ට වාර්ෂිකව ලැබෙන ප්‍රතිලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1945/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති උක් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රභේද කවරේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන උක් ප්‍රභේද කවරේද;

(iv) මොලැසස් වැඩිම ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන උක් ප්‍රභේදය කවරේද;

(v) මොලැසස් අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන උක් ප්‍රභේද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1972/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ගවල සම්පූර්ණ දිග කිලෝමීටර්වලින් කොපමණද;

(ii) මේ වනවිට ධාවනය කරනු ලබන දුම්රිය එන්ජින් සංඛ්‍යාව සහ දුම්රිය මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය කාලයේ ඉන්දියාවෙන් ආනයනය කරන ලද දුම්රිය මැදිරි හා එන්ජින් මේ වනවිට ධාවනයට යොදවා තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1995/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැඩි නියඟය හේතුවෙන් හම්බන්තොට, උඩවලව කලාපය, කිරම ඔය කලාපය සහ මලලආර කලාපය ඇතුළු ගිනිකොණදිග තැනිතලාවේ කලාප ගණනාවක වගා බිම් විනාශ වී ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා 'සුරකිමු රුහුණ' සංවිධානය විසින් යෝජනා කර ඇති, පැරණි වාරි සංරක්ෂණ පද්ධතිය විධිමත් කිරීම සහ තෙත් කලාපයේ අතිරික්ත ජලය ඉහත කලාපවලට යොමු කිරීම (කළු ගඟ හැරවීමේ ව්‍යාපෘතිය) යන විසඳුම් දෙක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඉහත සඳහන් කලාපවල පවතින ජල හිඟය මඟහැරවීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කඩිනම් පියවර කවරේද;

(iv) මේ වනවිට නවතා දමා ඇති ගිං ගඟ සහ නිල්වලා ගඟ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2011/2024

ගරු මයන්ත දිසානායක මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ග්‍රාම නිලධාරි වසමේ නම සහ පිරිසිදු පානීය ජලය නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මහනුවර දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2026/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් වර්ෂයේ එක් කන්නයක් පමණක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය, කන්න දෙකක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ කන්න තුනක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ඉඩම්වල වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2044/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ලබා ගන්නා ජනාධිපතිවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජනාධිපතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ලබා දී ඇති, රජයේ දීමනා ලබන කාර්ය මණ්ඩලය, එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් ජනාධිපතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් යොදවා තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ආරක්ෂාව සඳහා යොදවා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2058/2024

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මව්වරුන් රැකියාවට යන අවස්ථාවලදී, ඔවුන්ගේ දරුවන් රඳවා තැබීම සඳහා ළමා රැකවරණ මධ්‍යස්ථාන (créche) වතුයායන් ආශ්‍රිතව ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම මධ්‍යස්ථාන වෙත ඇතුළත් කර ගනු ලබන ළමයින්ගේ වයස් සීමාව කොපමණද;

(iii) මේ වනවිට, එම මධ්‍යස්ථානවල රැකබලා ගනු ලබන ළමයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ළමා රැකවරණ මධ්‍යස්ථාන භාර පාලිකාවක් සපුරා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එම මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේදී අනුගමනය කළ යුතු ප්‍රමිතීන් හා රෙගුලාසි කවරේද;

(iii) එවැනි ප්‍රමිතීන් සහ රෙගුලාසි නොමැති නම්, ඒවා සම්පාදනය කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2139/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර, හාඩි උසස් තාක්ෂණ ආයතනයේ කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර මේ වනවිට වර්ෂ 04ක පමණ කාලයක් ගත වී ඇතත්, එම පාඨමාලාව හදාරන සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට අත්‍යවශ්‍ය අංගයන් වන බෝග ගොවිපළක්, සත්ත්ව ගොවිපළක්, කුඹුරක් සහ වාරිමාර්ග පහසුකම් යන යටිතල පහසුකම් සපුරා නොමැති බවත්;

(ii) කෘෂි අංශ භාර ප්‍රධානීන් විසින් ඉහත පාඨමාලාව නිසි පරිදි අධීක්ෂණය නොකිරීම හේතුවෙන් කෘෂි විද්‍යා පාඨමාලාව සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන අධ්‍යාපන චාරිකා සංවිධානය නොකරන බවත්;

(iii) කෘෂි විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා ඉහළ ඉල්ලුමක් පැවතියද ඒ සඳහා අවශ්‍ය උපදේශකයන්ගේ හිඟය මගහරවා ගැනීම පිණිස බාහිර උපදේශකයන් බඳවා ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත ගැටලු සඳහා ලබා දෙන විසඳුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— රාජ්‍ය වත්කම් කළමනාකරණ,— කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; රාජ්‍ය ආයතනයක් විසින් පූර්ණ හිමිකම දරනු ලබන, පවරන ලද, අත්කරගන්නා ලද, පවරා ගන්නා ලද, දරන ලද හෝ උපයෝජනය කරන ලද මූල්‍ය නොවන නිශ්චල හෝ චංචල වත්කම් හඳුනා ගැනීම සහ එම වත්කම්වල ජාතික වත්කම් ලේඛනයක් සම්පාදනය කිරීම සඳහා ද; එකී ලේඛනය කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා සහ එකී වත්කම්වල නිසි ප්‍රතිලාභ රාජ්‍ය ආයතන වෙත ලැබීම තහවුරු කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන),— (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

3.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන),— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

4.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ගෙවල් කුලී (ඉවත් කිරීමේ),— 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

5.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ,— ගෙහිමියෙකු විසින් පරිශ්‍රයක පදිංචි වී සිටින තැනැත්තන් නෙරපීම වැළැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

6.
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— විනිමය පත්‍ර (සංශෝධන),— (82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

7.
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"(140 වන අධිකාරය වූ) මාතෘ ප්‍රතිලාභ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

8.
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"(129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

9.
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා දෘෂ්ටි විශේෂඥයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

10.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.12 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.
(අංක 02/2024 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27, 28 සහ 45 වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජුනි 06 දිනැති අංක 2387/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

3.

වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*4.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ආගමන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ආරක්ෂණ පියවර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නිවේදනය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 24 දිනැති අංක 2368/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සම්මතය,— විදේශ විනිමය සංචිත අඛණ්ඩව ක්ෂය වීම හේතුවෙන් ශ්‍රී ලංකාව, 2022 මාර්තු මාසයේදී ණය තිරසර අර්බුදයකට මුහුණපාන ලදින් ඉන් අනතුරුව, ශ්‍රී ලංකා මුදල් මණ්ඩලයේ උපදෙස් මත ආර්ථිකය තවදුරටත් පිරිහීම වැළැක්වීම පිණිස විදේශ රාජ්‍ය ණය ආපසු ගෙවීම ශ්‍රී ලංකාව විසින් අත්හිටවන ලද හෙයින් ද;

ජනතාව වෙත මෙම බරපතල ගැටලුව සම්බන්ධයෙන් විනිවිදභාවයකින් යුතු අනාවරණයක් සිදු කිරීමෙන් අනතුරුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ අර්බුදයට විසඳුමක් සෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදින්, පාර්ශ්වකරුවන්ගේ උපදේශනයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සිදුකරනු ලබන සාකච්ඡාවන්හිදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීමට මූල්‍ය උපදේශකවරු වශයෙන් ලසාඩ් (Lazard) සහ නීති උපදේශකවරු වශයෙන් ක්ලිෆර්ඩ් චාන්ස් එල්එල්පී (Clifford Chance LLP) පත් කරන ලද හෙයින් ද;

අභියෝග සහ හව්‍ය විසඳුම් පිළිබඳ විග්‍රහ කරමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පුළුල් සමාලෝචනයක් සිදු කළ අතර ණය තිරසරභාවය සම්බන්ධයෙන් තක්සේරුකරණයක් ද නිකුත් කරන ලදින්, ඉන් අනතුරුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මාර්ග සිතියමට අනුව ශ්‍රී ලංකාව විසින් සූක්ෂම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලද හෙයින් ද;

ද්විපාර්ශ්වීය ණය හිමියන් වෙත නැවත ණය ආපසු ගෙවීම් සහ ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් සඳහා සිදු කරන ගෙවීම් ද අන්තර්ගත විදේශ ණය ආපසු ගෙවීම අත්හිටවනු ලැබුවද, ශ්‍රී ලංකාව විසින් බහු පාර්ශ්වීය ණය හිමියන් වෙත ගෙවීම් සිදු කිරීම වෙනුවෙන් කැපවී සිටි හෙයින් ද;

2023 ජුනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, පාර්ලිමේන්තුව, රාජ්‍ය ණය තිරසරභාවය සහතික කරනු පිණිස ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය ප්‍රශස්ත කිරීමට තීරණය කරන ලද හෙයින් ද;

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිළිබඳ තක්සේරුකරණයට අනුකූලව ශ්‍රී ලංකාව විසින් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කරන ලදින්, ඉන් අනතුරුව, විදේශ ණයවල ඉතිරි කොටස් ද්විත්වය ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් සහ ස්වෛරී බැඳුම්කර හිමියන් වෙත සිදු කළ යුතු ගෙවීම්වලින් සමන්විත වන හෙයින් ද;

ප්‍රංශය, ජපානය සහ ඉන්දියාවේ නායකත්වයෙන් යුතුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිළිබඳ පරාමිතීන්ට අනුව ද්විපාර්ශ්වීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම උදෙසා නිල ණය හිමියන්ගේ කමිටුවක් (OCC) ස්ථාපිත කරන ලදින්, ශ්‍රී ලංකාව ඊට සමගාමීව, නිල ණය හිමියන්ගේ කමිටුව මෙන්ම එම පරාමිතීන් යටතේ චීන අපනයන හා ආනයන බැංකුව (EXIM Bank) සමඟ සාකච්ඡාවන්හි නිරත වූ හෙයින් ද;

අනාගත ධනාත්මක ණය සමාලෝචන සඳහා මඟ සලසමින් ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීන අපනයන හා ආනයන බැංකුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡා සාර්ථකව අවසන් කිරීම පිළිබඳ සඳහන් කරමින් 2024 ජූනි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ හෙයින් ද;

ශ්‍රී ලංකාව, මෙම ක්‍රමෝපායික සහ මිනිත ප්‍රවේශය හේතුවෙන් වැඩි දියුණු කරන ලද ණය ශ්‍රේණිගත කිරීමට එළැඹීම අපේක්ෂා කරනු ලබන අතර එමඟින් ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම් සලසනු ලබන හෙයින් ද;

ශ්‍රී ලංකා රජය විසින් සාර්ථකව පවත්වන ලද සාකච්ඡා මාලාවකින් අනතුරුව, කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකා රජය සහ නිල ණය හිමියන්ගේ කමිටුව ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් අවසන් ගිවිසුමකට පැරිසියේදී එළැඹී අතර ශ්‍රී ලංකා රජය සහ චීන අපනයන හා ආනයන බැංකුව ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් අවසන් ගිවිසුමකට බීජිංහිදී එළැඹෙන ලදින්, නව බැඳියාවක් සමඟින් ණය හිමි රටවල් සමඟ ද්විපාර්ශ්වීය ආර්ථික සබඳතා නැවත ආරම්භ කිරීමට ශ්‍රී ලංකාව වෙත මෙම ගිවිසුම් මඟ සලසනු ලබන හෙයින් ද;

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසරභාවය පිළිබඳ විශ්ලේෂණයට අනුව ණය තිරසරභාවය නැවත අත් කර ගැනීම සඳහා උපකාරි වන ලදින්, තවද වේගවත් ආර්ථික ප්‍රකෘතියකට පහසුකම් සලසමින්ද, තිරසර වර්ධනයක් ඇති කරලමින්ද ශ්‍රී ලංකාවේ ආර්ථිකය සුවිශේෂී අයුරින් පරිවර්තනය කිරීම සඳහා එකී ගිවිසුම් සූදානම් වන හෙයින්; සහ

2024 ජූනි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පහත ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම අවසර මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත ලබා දීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නිල ණය හිමියන්ගේ කමිටුව (OCC) අතර 2024 ජූනි 26 වැනි දින එළඹෙන ලද අවසන් ගිවිසුම; සහ

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන අපනයන හා ආනයන බැංකුව (EXIM Bank) අතර 2024 ජූනි 26 වැනි දින එළඹෙන ලද අවසන් ණය ගිවිසුම් සංශෝධන කිරීමේ ගිවිසුම.

*20.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මැයි 03 දිනැති අංක 2382/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 4),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූනි 28 දිනැති අංක 2390/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.26 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජුනි 18 දිනැති අංක 2389/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*25.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග,— (81 අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වගන්තිය සමඟ කියවිය යුතු 6 සහ 10 වගන්ති යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 28 දිනැති අංක 2364/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*27.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 19(2) වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 15 දිනැති අංක 2393/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

28.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42\.
අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43\.
හෙක්ටර් අප්පුහාමි හෙල්පින් හැන්ඩ් පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44\.
ජනරාජ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45\.
වන්නි මන් පුණ්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

2152/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත, බුද්ධිමය දේපළ පනත සහ සී/ස ආශා මිනරල්ස් පුද්ගලික සමාගමට බොහෝ කලකට පෙර සිටම අවශ්‍ය බලපත්‍ර හිමිකාරිත්වය දැරූ සී/ස පුත්තලම ඉල්මනයිට් සමාගමෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, ගවේෂණය හා සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් සී/ස ආශා මිනරල්ස් පුද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹීමට පාදක වූ හේතු සහ ක්‍රමවේද කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කර්මාන්ත අමාත්‍යාංශයේ 2023.05.23 දිනැති ලිපිය සම්බන්ධයෙන් පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) සී/ස පුත්තලම ඉල්මනයිට් සමාගම විසින් 2023.10.19 දින මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයේ ප්‍රතිඵලය කවරේද;

(iii) මුදල් අමාත්‍යාංශය විසින් පිළිවෙලින් 2024.01.30 සහ 2024.03.11 යන දිනයන්හිදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත ලබා දුන් උපදෙස් පිළිනොපැදීමට හේතු කවරේද;

(iv) රේඛීය අමාත්‍යාංශය සහ එකම කොටස් හිමියා වන භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත සිය අනුකූලතාවය බලාත්මක කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?